**හොරණ ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දිනද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2019 ජුලි 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019ජුලි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීමට වැය වු රු.2,801,506 ක් පුනරාවර්තන වැය යටතේ දක්වා තිබුණි. | ප්‍රග්ධන හා පුනරාවර්තන වියදම් වර්ගීකරණය නිවැරදිව ගිණුම්වල දැක්විය යුතුය. | ඉදිරියේදි නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල වෙනත් ආදායම් රු.213,789 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආදායම් වියදම් ගිණුමෙහි වර්ෂයට අදාල අදායම නිවැරදව ගිණුම් තැබිය යුතුය. | ඉදිරියේදි නිවැරදි කරමි. |
| (iii) | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගිණුමෙහි ආරම්භක ශේෂය වු රු.105,274 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට මාරු කිරිම වශයෙන් සඳහන් කරමින් සමුච්චිත අරමුදල් ගිණුමේ හරට හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ බැරට කළ සටහන් හේතුවෙන් එම ගිණුම් | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | දෙකෙහි අවසාන ශේෂයන් නිවැරදි නොවුණි. | | |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාලව සැපයුම් හා උපකරණ වියදම රු.48,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වර්ෂයට අදාල වියදම නිවැරදිව ගිණුම් තැබිය යුතු බව | අදහස් දක්වා නොතිබුණි. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාලව පොදු ගබඩා ශේෂය රු.163,299 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල වියදම් නිවැරදිව ගිණුම් තැබිය යුතු බව | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.102,100,648 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.33,809,354 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුය. | 2019 වර්ෂයේදි නොසැසඳිම් සොයා බලා නිවැරදිව උපලේඛන ලබා දිමට කටයුතු කරන බව |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සිට 2012 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.2,084,385 ක එකතු කළ අගය මත බදු මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණි. | අදායම් බදු දෙපාර්තමේන්තුවට කඩිනමින් ගෙවිය යුතු බව | විගණන නිරීක්ෂණය පිළිගනිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, තොග ලේඛන හා උප ලේඛන නොමැති වීම නිසා එකතුව රු.128,898,345 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කරන බව හා ඉදිරියේදී උප ලේඛන පිළියෙල කර ඉදිරිපත් කරන බව |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (i) 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටි නිශ්චල දේපළවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | පනත අනුව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේදී නව හඳුනා ගැනීම් සිදු කිරිමට කටයුතු කරමින් පවතින බව |
| | (ii) 160 වගන්තිය | 2,819,581 | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | පනත අනුව කටයුතු කල යුතුය | 2019 වර්ෂයේදී දේපල තහනම් කිරිමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති අනුව කටයුතු කල යුතුය. | රීති අනුව කටයුතු කර නොමැති බව පිළිගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1) (2) ඡේද | 102,932 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. | ආදායමට ගැනිමට කටයුතු කරමි. |

2, මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,909,159 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,900,792 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 16,486,494 | 11,769,297 | 15,885,487 | 2,842,981 | 15,528,874 | 13,102,390 | 13,939,952 | 3,745,463 |
| (ii) | කුලී | 4,263,000 | 2,388,532 | 1,747,744 | 201700 | 3,682,200 | 2,008,955 | 1,744,811 | 264,139 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,613,500 | 1,219,626 | 1,656,638 | - | 1,096,625 | 907,339 | 871,338 | - |
| (iv) | වෙනත් ආදායම් | 85,531,100 | 65,000,000 | 107,531,597 | 40,603,906 | 106,990,400 | - | 58,474,413 | - |

2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.3,479,501 ක් වූ අතර ඉන් රු.1,305,642 ක් හෙවත් සියයට 37 ක් 2019 ජූනි 20 දින වන විට අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කරමි. |
| (ii) | වසර 05 ඉක්ම වූ වරිපනම් බදු හිග ආදායම රු.825,593 ක් වූ අතර එම වටිනාකම මුළු වරිපනම් බදු හිඟයෙන් සියයට 29 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කරමි. |

2.2.3 විනෝද බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව විනෝද බදු බිල් කිරීම රු.513,574 ක් වූ අතර. වර්ෂය තුළ ඉන් රු.321,131 ක් හෙවත් සියයට 62 ක් අයකරගෙන නොතිබුණි.කෙසේ වුවද 2019 මැයි 13 දින වන විට හිඟ ශේෂය රු.256,891 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අයවිය යුතු හිඟ මුදල සමාන වාරික වාරික 10 කින් අය කිරිමට මහා සභා තීරණයක් ගෙන ඇත. |

2.2.4 වෙළඳ බලපත්‍ර ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරිමට ප්‍රථම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ නිර්දේශ ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන 06 ක් සඳහා නිර්දේශ ලබා නොගෙන වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ නිර්දේශ ලබාගතයුතු ව්‍යාපාරික ස්ථාන සඳහා නිර්දේශ ලබාගත යුතුවේ. | 2019 වර්ෂයේදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශ ලබා ගැනිමට කටයුතු කරමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.30,000,000 ක් හා මුද්දර ගාස්තු රු.39,270,556 ක් විය. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුද්දර ආදායම් ලබා ගැනිම හා හිඟ උසාවි දඩ මුදල් ගෙන්වා ගැනිමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | පිළිතුරක් සපයා නැත. |
| **(ආ) ක්‍රියාකාරි සැලැස්ම** | | |
| (i) 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම තුළ හඳුනාගත් රු.3,150,000 ක පිරිවැය වූ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වේ. | ඉදිරියේදි නිවැරදිව ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කරමි. |
| (ii) 2018 වර්ෂයේ සභාව විසින් රු.මි.18.9 ක් වූ මාර්ග 20 ක් සංවර්ධනය කර තිබුණ ද ක්‍රියාකාරි සැලැස්මේ හඳුනාගත් ව්‍යාපෘති යන්න තහවුරුවක් නොවුණි. | ක්‍රියාකාරි සැලැස්ම නිවැරදිව පිළියෙල කල යුතුවේ. | 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම නිලධාරි පාලන කාලයේ සකස් කල බවත් ක්‍රියාත්මක කිරිම මහජන නියෝජිත පාලන කාලයේ සිදු කිරිම නිසා එම නියෝජිතයින්ගේ යෝජනා වලට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කල බව |
| **(ඇ) කර්තව්‍යයන් ඉටු කිරිමේ ප්‍රමාදයන්** | | |
| ඇස්තමේන්තු පිරිවැය රු.5,755,986 ක් වූ වගවත්ත කසල අංගනය ඉදිකිරිමේ ව්‍යාපෘතිය 2018 ජනවාරි 18 අවසන් කිරිමට | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | ඉදි කිරිම් ප්‍රමාද වූ කාලයට ප්‍රමාද ගාස්තු අය කිරිමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| සැලසුම් කලද 2019 ජනවාරි 31 වන විටත් අවසන් කර නොතිබුණි. | | |

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| | | |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා කසල කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.34,361,719 ක වියදමක් දරා තිබුණි.කසල කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණ අතර කසල පිරිවැය අවම කර ගැනීම සඳහා කසල බදු පැනවීමක්ද සිදු කර නොතිබුණි. | කසල කළමනාකරණය සඳහා වන පිරිවැය අවම කර ගැනිමට කටයුතු කලයුතු අතර කසල කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | කසල කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කරමින් පවතින බවත් , කසල බදු පැනවීමටත් කටයුතු කරන බව දන්වමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| (i) මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.1 වගන්තිය යටතේ දිළිඳුකම පිටු දැකීම සඳහා 2018 වර්ෂයේදී වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනිමට කටයුතු කල යුතුවේ. | 2017 වර්ෂයේදි දිළිඳුකම පිටු දැකීමට එක් වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇති බව දන්වමි. |
| (ii) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන චක්‍රලේඛය අනුව අයවැය ඇස්තමේන්තු සකස් කිරිමේදී චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති උපාය මාර්ග තුන නිලධාරින් දැනුවත් වී නොතිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ දත්ත රැස් කිරිමේ කාර්යය සඳහා නිලධාරින් යොදවා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ආයතන ප්‍රධානින් හා කාර්යය මණ්ඩලය දැනුවත්ව නොතිබීම හා කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු මත ඒ වෙනුවෙන් නිලධාරින් යොමු කිරිමට නොහැකි බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ------------ | ---------------------- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>---------------------------------- | | |
| (i) අනුමත සේවක සංඛ්‍යාව තුළ සංවර්ධන නිලධාරි 09 ක් පවතින නමුත් තත්‍ය | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කර ගත යුතුය. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර |

| | | |
|---|---|---|
| සංඛ්‍යාව 08 ක් වීමෙන් එක් පුරප්පාඩුවක් පැවතුණි. | | ඇති බව දන්වමි. |
| (ii) ද්විතීයික තනතුරු 6 ක හා තෘතීය තනතුරු 11 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගත යුතුවේ. | ඉදිරියේදි බඳවා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටින තනතුරු 03 ක් සඳහා ආදේශක සේවකයින් 12 දෙනෙකු බඳවා ගැනීම වෙනුවෙන් වර්ෂය තුල රු.6,947,341 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි | ආදේශක කාර්ය මණ්ඩලය බඳවා ගැනිම හැකිතාක් අඩු කල යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව |

3.3 හඳුනාගත් පාඩු
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කනන්විල උප කාර්යාලයේ රු.243,277 ක පිරිවැයක් වූ තාර බැරල් 15.35 ක ඌණතාවයක් තිබුණි. | ඌණතාවය හඳුනාගෙන වගකිව යුතු නිළධාරින්ගෙන් අයකළ යුතුවේ. | මූලික පරික්ෂණයක් කර අදාල මුදල අයකර ගැනිමට කටයුතු කරමි. |

3.4 වාහන පාලනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 15 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | සියළු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගත යුතුය. | වාහන ආදායම් බලපත්‍රය ලබා ගැනිමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය
---------------

3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (ආ) මිල්ලෑව ඔව්ලාන මාර්ගය ඉදිකිරිම සඳහා මිළදි ගෙන තිබූ රු.462,503 ක පිරිවැය වූ අමුද්‍රව්‍ය මිණුම්කර තහවුරුවක් ලබා ගෙන නොතිබුණි. තවද අමුද්‍රව්‍ය මිළදී | මාර්ග ඉදිකිරිම සඳහා මිළදී ගන්නා අමුද්‍රව්‍ය සැපයුම්කරු විසින් සපයන අවස්ථාවේ මිණුම්කර එහි නිවැරදිතාවය තහවුරු කර ගත යුතුවේ. | වර්ෂය අවසානයේ පළාත් සභා හා විමධ්‍යගත ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් සිදු කිරිමට සිදු වීම නිසා සහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම ප්‍රමාද විය. |

| | | |
|---|---|---|
| ගෙන මාස 1 ½ කට වඩා වැඩි කාලයක් අනාරක්ෂිතව වැඩ ආරම්භ කිරීමකින් තොරව පැවතුණි. | | |
| (ආ) වටිනාකම රු.507,200 ක් වූ තාර බැරල් 32 ක් ගබඩා තොග පොත් වල නිකුතු නියෝග සටහන් කිරීමකින් තොරව නිකුත් කර තිබුණි. | ද්‍රව්‍ය නිකුත් කිරීමේදි නිකුත් නියෝග මගින් ද්‍රව්‍ය නිකුත් කලයුතු වේ. | ප්‍රමාද දෝෂයකින් නිකුත් නියෝග ලිවීමකින් තොරව ද්‍රව්‍ය නිකුත් කර තිබූ බව දන්වමි. |
| (ඇ) සභාව විසින් තාර දමා සංවර්ධනය කර තිබුණු මාර්ග 03 ක් සඳහා ඇස්තමේන්තු මඟින් ඉල්ලුම් කර තිබූ රු.95,520 ක් වටිනා තාර බැරල් 08 ක් නිකුත් කර නොතිබීම නිසා මාර්ගයේ ගුණත්වය අඩු මට්ටමක පැවතුණි. | මාර්ග සංවර්ධනය සඳහා ඇස්තමේන්තු මගින් ඉල්ලුම් කරන ද්‍රව්‍ය ව්‍යාපෘති සඳහා භාවිතා කලයුතු වේ. | ඇස්තමේන්තු කරන ලද ද්‍රව්‍ය ප්‍රමාණය භාවිතා කර ඇත. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 4.1 නොවිසදී ඇති විගණන නිරීක්‍ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 විගණකාධිපති වාර්තාවේ 2.2.4(ඇ) හි ඡේදය. | වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගත යුතුවේ. | වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනිමට කටයුතු කරමි. |
| (ආ) 2016 විගණකාධිපති වාර්තාවේ 2.2 (ඇ) හි ඡේදය. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කල යුතු වේ. | 2017 ගිණුම්කාරක සභා නියෝග අනුව වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනිමට නියෝග ලබා දී ඇත. |